## <u>බහු වරණ ප්‍රශ්න :</u>

01. පාදය නොදන්නා 10000 නම් සංඛ්‍යාවකින් 1 ක් අඩුකල විට ලැබෙන සංඛ්‍යාවට සමාන විය නොහැක්කේ කුමක් ද?

i. $FFFF_{16}$ ය. ii $1111_2$ ය. iii 9999 ය. iv $11111_8$ ය.

02. $p=14_{16}$ හා $q=1010_2$ නම් p - q හි අගය පෙන්නුම් කරන්නේ කුමන පිළිතුරෙහි ද?

i. $1010_2$ ii. $04_{10}$ iii. $10_{16}$ iv. $10_2$

03. $1010_2$ ට තුල්‍ය දශමය සංඛ්‍යාව කුමක් ද?

i. 5 ii. 6 iii. 10 iv. 12

04. $35_8$ ට තුල්‍ය වන දශමය සංඛ්‍යාව දැක්වෙනුයේ කුමන පිළිතුරෙහි ද?

i. 232 ii. 280 iii. 43 iv. 29

05. $010100100010_2$ යන ද්විමය සංඛ්‍යාවේ MSBහා LSB පිළිවෙලින් පෙන්නුම් කරන්න.

i. 0,0 ii. 0,1 iii. 1,0 iv. 1,1

06. $1234_{10}$ යන සංඛ්‍යාවේ 1 මගින් නිරූපණය වන්නේ කිනම් ස්ථානීය අගයක් ද?

i. $10^0$ ii. $10^1$ iii. $10^2$ iv. $10^3$

07. $101.1_2$ සංඛ්‍යාවට සමාන දශමය සංඛ්‍යාව දී ඇති පිළිතුර තෝරන්න.

i. 5.1 ය. ii. 11 ය. iii. 1.1 ය. iv. 5.5 ය.

08. 66223 දශමය සංඛ්‍යාව ෂඩ්දශමය සංඛ්‍යාවක් බවට හැරවූ විට අගය කුමක් ද?

i. $1DD4_{16}$ වේ. ii. $116AC_{16}$ වේ. iii. $102FA_{16}$ වේ. iv $102AF_{16}$ වේ.

09. එක්තරා සංඛ්‍යා පද්ධතියක් සඳහා භාවිත වන සංඛ්‍යාංක (Digits) ගණන 7 කි. මෙම සංඛ්‍යා පද්ධතියේ පාදය දැක්වෙනුයේ කුමන පිළිතුරෙහි ද?

i. 6. ii. 7. iii. 8. iv. 16.

10. A හි ඇස්කි අගය 1000001 නම් C හි ( ASCII ) ඇස්කි අගය දක්වන්න.

i. $1100111_2$ වේ.

ii. $011111_2$ වේ.

iii. $011111_2$ වේ.

iv. $1000011_2$ වේ.

11. පහත සඳහන් අගයන් ගෙන් BCD අගයක් විය නොහැක්කේ කුමක් ද?

i. 0111 ii. 1000 iii. 1001 iv. 1010

The National e-learning Portal for The General Education

12. සංඛ්‍යා පද්ධති වලින් දැක්වෙන පහත අගයයන් සලකා බලන්න.

a). $10_2$ b). $10_8$ c). $10_{10}$ d). $10_{16}$

ඒ අනුව නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. සියලුම සංඛ්‍යා අගයෙන් සමානය.

ii. සියලුම සංඛ්‍යා දශමය සංඛ්‍යා පද්ධතියේ 10 අගයට සමාන.

iii. සියලුම සංඛ්‍යා විසින් තමා අයිති සංඛ්‍යා පද්ධතියේ පාදයේ අගය නිරූපනය කරයි.

iv. සියලුම සංඛ්‍යා ද්විමය සංඛ්‍යා පද්ධතියේ දෙක අගය නිරූපනය කරයි.

13. මේසයක දිග සහ පළල ඒකක 25 සහ 22 වේ. එය පිළිවෙළින් දැක්වා ඇත්තේ කුමන පිළිතුරෙහි ද?

i. $11001_2$ සහ $25_8$ ය. ii. $11001_2$ සහ $26_8$ ය.

iii. $31_8$ සහ $10111_2$ ය. iv. $31_8$ සහ $25_8$ ය.

14. මෙගාබයිට 4 ක අන්තර්ගතය දක්වන්න.

i. බයිට $2^7$ කි. ii. බයිට $2^{22}$ කි. iii. බයිට $4X2^{10}$ කි. iv. බයිට $4 X10^{20}$ කි.

15. $11011101111_2$ ද්විමය සංඛ්‍යාව ෂඩ්දශමය බවට පරිවර්තනය කළ විට නිවැරදි අගය දැක්වෙන පිළිතුර කුමක් ද?

i. $DD4_{16}$ වේ ii. $6AC_{16}$ වේ iii. $6DC_{16}$ වේ iv. $6EF_{16}$ වේ

16. සීමිත ඕවර 2020 ක්‍රිකට් තරගයක දී පළමුව පන්දුවට පහරදුන් A කණ්ඩායම ඕවර 20 අවසානයේදී ලබාගත් ලකුණු සංඛ්‍යාව 128 කි. ඊට පිළිතුරු වශයෙන් දෙවනුව පහර දුන් B කණ්ඩායම ඕවර 18 පන්දු 5 කදී, සියලු දෙනා දැවී ගිය අතර ඔවුන් තරගය ලකුණු 45 කින් පරාජය විය. B කණ්ඩායම ලබාගත් ලකුණු සංඛ්‍යාව කොපමණ ද?

i. $101101_2$. කි ii. $123_8$ කි iii. $213_{16}$ කි iv. $113_8$ කි

17. $AC_{16}$ ෂඩ්දශමය සංඛ්‍යාවට තුල්‍ය අෂ්ටක සංඛ්‍යාව සොයන්න.

i. $375_8$ ii. $FD_8$ iii. $254_8$ iv. $1011_8$

18. $3 \times 2^{30}$ බයිට ($3 \times 2^{30}$ Byte) ප්‍රමාණයට සමාන වටිනාකම දැක්වෙන්නේ පහත කුමන පිළිතුරෙහි ද?

i. $3x2^{33}$ bits. ii. 3x2048 bits. iii. 3x2048 KB. iv. 3x8x1000 x1000 KB.

19. සංයුක්ත තැටියක (Compact Disk) ධාරිතාවට තුල්‍ය වන්නේ කුමක්ද?

i. $111000000_2$ ii. $1274_8$ iii. $127_8$ iv. $1110000100_2$

20. ඉෂාරා සතුව 512MB ධාරිතාවක ගොනුවක් (file) ද, දුලාරි සතුව 1GB ගොනුවක් ද ඇත්නම් දෙදෙනා සතුව ඇති ගොනු දෙකෙහි මුලු ධාරිතාව කොපමණ ද?

i. $10^9$ KB ii. $2^{19}$ KB iii. $(2^9 + 2^{10})$ MB iv. $2^{29}$ KB

***